උතුරු පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල කාර්ය සහයක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

උතුරු පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල කාර්ය සහයක තනතුරට අදාළව පවතින පුරප්පාඩු වලට බඳවා ගැනීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්න අවසන් දිනය 2015.11.16 වේ.

02. සාමාන්‍ය සුදුසුකම් :

2.1 අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.

2.2 උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. එනම් අයදුම්පත් භාරගන්න අවසාන දිනට පූර්වාසන්නයෙන් වර්ෂ 06 ක කාලයෙන් අඩු වශයෙන් වර්ෂ 03 ක් වත් උතුරු පළාත තුළ ස්ථිරව හා නොකඩවා පදිංචිය ඇති අයෙක් විය යුතුය.

හෝ

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවුරුදු 05 ක් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටිය යුතුය.

(සම්මුඛ පරීක්ෂණයේදී ජාතික හැඳුනුම්පත ලේඛනය මගින් සමස්තයේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය තහවුරු කළ යුතුය)

2.3 යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.

03. තනතුරට අදාළ සුදුසුකම් :

3.1 **වයස් සීමාව :** අයදුම්පත් භාරගන්න අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනට විශ්‍රාම වැටුප් සහිත රජයේ ස්ථිර සේවයේ නියුතු අය හට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

3.2 **අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී වාර දෙකකට නොවැඩි ගණනකදී භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමස්තය යුතු අතර අවුම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

04. වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (A) ට අනුව මාසික වැටුප් පරිමාණය යි. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600/- වේ. (PL - 1 - 2006-A)

05. විභාගය හා විෂය නිර්දේශය

පත්වීමට සුදුසුකම් ලැබීම සඳහා වන ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුතු වේ. මෙම විභාගය සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන් දෙකෙන්ම පැවැත්වේ.

අංකය	විෂය	කාලය (පැය)	විෂය නිර්දේශය	මුළු ලකුණු	සමත් වීමට අවශ්‍ය ලකුණු
01	මූලික පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම	01	අපේක්ෂකයාගේ ගණිතමය හැකියාව හා තර්කානුකූලව තීරණ ගැනීමේ හැකියාව යනාදිය පරීක්ෂා කිරීමට අදාළ වන ප්‍රශ්න හා අධ්‍යාපන, දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සාමාජීය, විද්‍යාව, ශ්‍රීලංකා යනාදියට අදාළ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීමට අදාළ වන ප්‍රශ්න 50 කින් යුක්ත වේ.	100	40
02	භාෂාව	1 1/2	ලිපි ලිවීම, සේරුම් ගැනීමේ හැකියාව, සමාන වචන, විරුද්ධ පද, ව්‍යාකරණ තාවිකය යනාදියට අදාළ දකුම් පරීක්ෂා කිරීමට අදාළ වන ප්‍රශ්න වලින් යුක්ත වේ.	100	40

06. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :

6.1 අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටි කොන්දේසි වලට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.2 මෙම පත්වීම ස්ථාන මාරු සහිත පත්වීමක් වන අතර මෙම පත්වීම ලබන අය උතුරු පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 ලිඛිත පරීක්ෂණයේ සුසලතාව මත බඳවා ගන්නා අවස්ථාවේ ක්‍රියාත්මක ව ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට ද, බඳවා ගැනීමේ පරිපාටිවලට ද, රජයේ හා පළාත් ප්‍රතිපත්ති වලට ද අදාළව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී මෙම දැන්වීම ඉල්ලා සිටින සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර මෙහිදී අමතර ලකුණු ලබාදීමේන් සිදු නොකෙරේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් නොකරන ලද සහතික පිළිබඳ පසුව සලකා බැලීමක් සිදු නොකෙරේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුරට අයත් නිමිතම සියල්ල අහෝසි කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය පැවැත්වීම ලබන අයදුම්පත් සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ. අදාළ සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබේ. පත්වීම සඳහා සේරුමේදී ස්ථිර පදිංචිය සැලකිල්ලට ගනු ලැබේ.

7.2 මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර මෙහි සඳහන් කර ඇති සුදුසුකම සපුරා තිබිය යුතුය. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.3 කාර්යාල කාර්ය සහයක සේවයේ තනතුරට අදාළ පුරප්පාඩු වලින් 3% ක් ආබාධිත පුද්ගලයන් හට වෙන් කරනු ලැබේ. ආබාධිත අපේක්ෂකයන් පත්වීම සඳහා සේරුමේදී අදාළ තනතුරෙහි රාජකාරී මැනවින් ඉටු කිරීමට හැකි බවට වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය. ආබාධිත තත්ත්වය හේතුවෙන් අදාළ පුද්ගලයාගේ වැඩ කිරීමේ හැකියාව කොපමණ ප්‍රතිශතයකින් අඩුවේ ද යන්න වෛද්‍ය වාර්තාවේ සඳහන් කළ යුතුය.

7.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළව වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ වලට අනුව සේවයට බැඳී අවුරුදු 05 ක් තුළදී අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලබා තිබිය යුතුය.

08. විභාග ගාස්තු

අයදුම්කරුවන් පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවූ රු. 500/- ක මුදල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 3003 තැන්පත් කිණුමට මුද්‍රේ ගෙවා ලබාගන්න ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත තීරුවේ නොඇලවෙන ලෙස අලවා එවිය යුතුය. කිසිම හේතුවක් නිසාවත් ගෙවන විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන බවත්, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවත් සැලකිල්ලට ගත යුතුය.

09. අයදුම්කරන ක්‍රමය

9.1 මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ (සෙ.මී. 21 x සෙ.මී. 29) නොඅඩුවක දෙපසම තාවිකයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතුය. පළමු වන පිටුවේ 1 සිට 12 දේදය දක්වාද, අනෙකුත් දේද දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි අයදුම්පත් සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2015.11.16 දිනට** හෝ ඊට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

9.2 ඉල්ලුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම තනතුර සඳහා අයදුම් කරන ලද ඉල්ලුම්පත්‍රය වෙනත් තනතුරක් සඳහා මාරු කිරීමට ඉඩ ලබා නොදෙන අතර මේ සම්බන්ධයෙන් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9.3 මේ වන විට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන නිලධාරීන් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් තම අයදුම්පත ඉදිරිපත් කළහොත් පමණක් ඔවුන්ගේ සේවය විශ්‍රාම වැටුප ගණනය කිරීමට ඇතුළත් කරනු ලැබේ.

9.4 නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.5 ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පතේ ඡායා පිටපත හෝ කලින් එවනු ලබන පිටපත භාරගනු නොලැබේ. විභාගයට අදාළ වන ප්‍රවේශ පත්‍ර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව** මගින් එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර එවීම ඔබගේ සුදුසුකම් සනාථ කළ බව සැලකිල්ලට නොගත යුතුය.

9.6 විභාග පැවැත්වීමේ දිනය සම්බන්ධයෙන් පුවත්පත් මගින් දන්වනු ලැබේ.

9.7 මෙම විභාගයට පෙනී සිටීමට දින 03 කට ප්‍රථමයෙන් ප්‍රවේශ පත්‍ර නොලැබ තිබේ නම් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට දන්විය යුතුය **(දුරකථන අංකය / ෆැක්ස් අංකය 021-2219981)**

10. අසත්‍ය බව තහවුරු වූ විට ලැබෙන දඬුවම්

අයදුම්පත්‍ර පිරවීමේදී අනා සැලකිල්ලෙන් නිවැරදි තොරතුරු සැපයිය යුතුය. අයදුම්කරු ඉදිරිපත් කළ යම්කිසි තොරතුරක් අසත්‍ය බව තහවුරු වුවහොත් සුදුස්ස අවස්ථාවකදී හෝ අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළ හැක.

11. විභාග මධ්‍යස්ථාන

විභාග පැවැත්වීමට නියමිත විභාග නගරය හා නගර අංකය පහත දැක්වේ.

නගර	නගර අංකය	නගර	නගර අංකය	නගර	නගර අංකය	නගර	නගර අංකය
යාපනය	01	වවුනියාව	03	මුලතිව්	05	චාවකච්චේරි	07
මන්නාරම	02	කිලිනොච්චි	04	කනගරායන්කුලම්	06	කෙල්ලි අඩි	08

මෙම විභාග නගර වලට අදාළව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අඩු වුවහොත් ලබන පිහිටි විභාග නගරය වෙත මාරු කරනු ලැබේ.

12. මෙම දැන්වීමේ සඳහන් හොසකළ හෝ අපැහැදිලි කරුණු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අවසන් තීරණය ගනු ලැබේ.

13. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීමේ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතු වේ.

14. මෙම තනතුරු පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම නොපිරවීමේ බලය පත්වීම බලධාරියා සතු වේ.

15. භාෂා පරීක්ෂණයේදී සිදුවන වෙනස්කම් පිළිබඳව සැලකීමේදී දෙමළ භාෂාව නිවැරදි වේ.

16. මෙම දැන්වීම උතුරු පළාත් සභාවේ www.np.gov.lk වෙබ් අඩවිය තුළද අන්තර්ගතය.

ආර්. වරදලිංගම්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.

2015.10.15

ආදර්ශ අයදුම් පත්‍රය

උතුරු පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල කාර්ය සහයක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

තෝරාගන්නා ලද විභාග නගර අංකය : ☐ විභාග අංකය : ☐

(11 වන දේදයේ සඳහන් පරිදි විභාග නගර අංකය සඳහන් කරන්න) (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

තෝරා ගන්නා ලද විභාග නගර : ☐

විභාගයට පෙනී සිටින මාධ්‍ය : දෙමළ : T / සිංහල : S ☐

01. අයදුම්කරුගේ නම (මුලතුරු සමග) මා/මිය/මෙනවිය :

සිංහලෙන් : .....

ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) : .....

02. මුලතුරුවලින් සැඳහිවෙන නම

සිංහලෙන් : .....

ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) : .....

03. කැපැල් ලිපිනය

සිංහලෙන් : .....

ඉංග්‍රීසියෙන් (කැපිටල් අකුරින්) : .....

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ M ☐ ස්ත්‍රී F ☐

(සුදුසු ස්ථානයේ X ලකුණ යොදන්න)

07. උපන් දිනය : වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

2015.11.16 දිනට වයස වර්ෂ : ☐ මාස : ☐ දින : ☐

08. ජාතිය : ලංකා දෙමළ ☐ සිංහල ☐

මුස්ලිම් ☐ (සුදුසු ස්ථානයේ X ලකුණ යොදන්න)

09. (1) ඔබගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (02 වන දේදයට අනුව) .....

(2) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : .....

(3) පදිංචිව සිටින කාල සීමාව : ..... සිට : ..... දක්වා

10. අධ්‍යාපන සුදුසුකම් :

10.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය 1.

වර්ෂය : ..... විභාග අංකය : .....

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
1		6	
2		7	
3		8	
4		9	
5		10	

10.2 අ.පො.ස. (සා/පෙළ) විභාගය 2.

වර්ෂය : ..... විභාග අංකය : .....

විෂය	ශ්‍රේණිය	විෂය	ශ්‍රේණිය
1		6	
2		7	
3		8	
4		9	
5		10	

11. ඔබ කවරදක හෝ කවර හෝ වෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත ☐ (සුදුසු ස්ථානයේ x ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සඳහන් කරන්න. .....

12. මෙම දැන්වීමේ 7.3 දේදයට අනුව ඔබ ආබාධිත තත්වයකින් පසුවන අයෙක්ද?

ඔව් ☐ නැත ☐

ඔව් නම් ආබාධිත තත්වය හේතුවෙන් වැඩ කිරීමේ හැකියාව අඩුවීමේ ප්‍රතිශතය කොපමණ ද?

.....

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර.

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : .....

(ii) ලදුපත් අංකය හා දිනය : .....

(iii) ගෙවූ මුදල : .....

ලදුපත නොහැලවෙන සේ මෙහි අලවන්න

(ලදුපතේ පිටපතක් ලබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව හෙරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් නොසසන් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විද දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර තුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : .....

.....

අයදුම්කරුගේ අත්සන

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු / ඇය මා ඉදිරිපිටදී ..... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.....

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

අත්සන සහතික කරන නිලධාරියාගේ,

සම්පූර්ණ නම : .....

තනතුර : .....

ලිපිනය : .....

(තනතුර නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය)

දිනය : .....

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් හට පමණි) :

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර වශයෙන් සේවය කරන ..... මා/මිය / මෙනවියගේ ඉල්ලුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරා පත් කරන අවස්ථාවේදී ඔහුට මුදල් හැරීමට හැකි බවටත් ඔහු / ඔහුගේ පසු ගිය වසර ..... ක සේවා කාලයේ කිසිම විනය විරෝධී ක්‍රියාවල නියැලී නොසිටි බවටත් ඔහුගේ වැටුප් වැඩිවීම් සියල්ලම ලබාගත් බවටත් මෙහි ඔහු විසින් සඳහන් කරන ලද තොරතුරු සියල්ල නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

දිනය : .....

.....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

සම්පූර්ණ නම : .....

තනතුර : .....

ලිපිනය : .....

නිල මුද්‍රාව : .....